සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශය

# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

# බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය
# පියවර II අදියර 2

## ඇබෑර්තු (කොන්ත්‍රාත් පදනමින්)

මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද, 2019-03-15 දිනැති අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි ඉහත සඳහන් ව්‍යාපෘතියෙහි පවත්නා පහත සඳහන් තනතුරු පිරවීම සඳහා, සුදුසුකම්ලත් හා ක්‍රියාශීලී ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - තනතුරු 01

**සුදුසුකම් : (පහත i, ii, iii හෝ iv)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක්,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, සිවිල් ඉංජිනේරු උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **හෝ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

අවම වශයෙන් වසර 15 ක කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය. **හෝ**

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක්,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, සිවිල් ඉංජිනේරු උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **සහ**

පිළිගත් වෘත්තීය සිවිල් ඉංජිනේරු ආයතනයකින් ලබාගත් ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්, **හෝ**

සිවිල් ඉංජිනේරු පශ්චාත් උපාධියක් සමග අවම වශයෙන් වසර 13 ක කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් තිබිය යුතු අතර, ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය. **සහ**

iii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක්,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, සිවිල් ඉංජිනේරු උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **සමග**

සිවිල් ඉංජිනේරු පශ්චාත් උපාධියක්, **සහ**

පිළිගත් වෘත්තීය සිවිල් ඉංජිනේරු ආයතනයකින් ලබාගත් ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්.

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 11 ක කළමනාකරණ තලයේ පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 5 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය. **හෝ**

iv. රජයේ දීපව්‍යාප්ත සේවයේ I පංතිය නිලධාරියකු හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන තනතුරක්, **සමග**

අවම වශයෙන් වසර 06 ක, I පංතිය තනතුරක පළපුරුද්ද.

**වැටුප : තලය PS2- රුපියල් 185,000/-**

### 02. ව්‍යාපෘති කොන්ත්‍රාත් විශේෂඥ - තනතුරු 01

**සුදුසුකම් : (පහත i හෝ ii හෝ iii)**

i විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක්,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, සිවිල් ඉංජිනේරු උපාධියට සමාන බවට පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්, **හෝ**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 14 ක කොන්ත්‍රාත් කළමනාකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය. **හෝ**

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක්,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බවට පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්. **හෝ**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්.

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්, ආයතනික වරලත් සාමාජිකත්වය හෝ පිළිගත් සිවිල් ඉංජිනේරු වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද,

**හෝ**

iii. රජයේ දීපව්‍යාප්ත සේවයේ I පංතියේ නිලධාරියකු වීම හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන තනතුරක්, **සමග**

I පංතිය තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

**වැටුප : තලය PS3 - රුපියල් 180,000/-**

### 03. සිවිල් ඉංජිනේරු - තනතුරු 02

### 04. විදුලි ඉංජිනේරු - තනතුරු 01

### 05. ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු - තනතුරු 01

### 06. යාන්ත්‍රික ඉංජිනේරු - තනතුරු 01

### 07. වාස්තු විද්‍යාඥ - තනතුරු 01

### 08. මානව සම්පත් පරිපාලන - තනතුරු 01

### 09. ව්‍යාපෘති ගණකාධිකාරි - තනතුරු 01

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බවට පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්, **හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද, **හෝ**

ii. රජයේ දීපව්‍යාප්ත සේවයේ III/II හෝ ඉහළ පංතියක නිලධාරයකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්, **සමග**

සුදුසුකම් ලැබීමෙන් පසුව, III/II පංතිය තනතුරක, අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද.

**වැටුප : තලය PS4A- රුපියල් 155,000/-**

### 10. ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක - තනතුරු 01

**සුදුසුකම් : (පහත i, ii හෝ iii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රමාණ සමීක්ෂක ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වීම, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, ඉහත උපාධියට සමාන බවට පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්, **හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්, **හෝ**

තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ, තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළ, ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද.

ii. තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් විසින් නිකුත් කළ, තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළ, ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර 11 ක විශේෂඥතා පළපුරුද්ද, **සහ**

තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් විසින් නිකුත් කළ, තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළ, ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද.

**වැටුප : තලය PS 5 - රුපියල් 105,000/-**

### 11. ගිණුම් සහකාර - තනතුරු 01

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්, **සහ**

ICAS / CIMA / ACCA විභාගයන්හි ආවසරික / අන්තර් මධ්‍ය සහතික ලබා තිබීම.

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

**වැටුප : තලය PS 6 - රුපියල් 67,000/-**

### 12. විගණන සහකාර - තනතුරු 01

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්, **සහ**

ii. ICAS / CIMA / ACCA විභාගයන්හි ආවසරික / අන්තර් මධ්‍ය සහතික ලබා තිබීම.

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

**වැටුප : තලය PS 6 - රුපියල් 67,000/-**

### 13. ප්‍රසම්පාදන නිලධාරි - තනතුරු 01

**සුදුසුකම් : (i, ii, iii හෝ iv)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

**හෝ**

ii. සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

**හෝ**

iii. අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සමග**

සුදුසුකම් ලැබීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 9 ක පළපුරුද්ද,

**හෝ**

iv. අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත්, ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සමග**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 14 ක පළපුරුද්ද.

**වැටුප : තලය PS 6 - රුපියල් 67,000/-**

### 14. තාක්ෂණ නිලධාරි (සිවිල් - තනතුරු 01)

**සුදුසුකම් : (i, ii හෝ iii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක්

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිවිල් ඉංජිනේරු උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **හෝ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන සුදුසුකම්, **හෝ**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ තනතුරකට අදාළ, ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සමග**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද. **සමග**

ii. තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව, තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ, ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සමග**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද, **සහ**

iii. තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව, තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කළ, ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සමග**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 14 ක පළපුරුද්ද.

**වැටුප : තලය PS6 - රුපියල් 67,000/-**

### 15. ව්‍යාපෘති ලේකම් - තනතුරු 01

**සුදුසුකම් : (i හෝ ii)**

i. ඉංග්‍රීසි හා සිංහල / දෙමළ භාෂා ඇතුළත්ව සම්මාන තුනක් (03) සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස (සා/පෙළ) විභාගය සමත්ව තිබීම. **සමග**

පිළිගත් ආයතනයකින් ලේකම්කරණ පාඨමාලාවක් හදාරා තිබීම හෝ වරලත් ලේකම්කරණ විභාගයට ඉගෙන ගනිමින් සිටීම. **සමග**

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද **හෝ**

ii. වරලත් ලේකම්වරයකු වීම සමග ලේකම්වරයකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

ව්‍යාපෘති ලේකම්වරයකු ලෙස ව්‍යාපෘතිවල පළපුරුද්ද අමතර වාසිදයක වනු ඇත.

**වැටුප : තලය PS6 - රුපියල් 67,000/-**

### 16. ලංසු ලේඛක ලිපිකරු - තනතුරු 03

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී, විෂයයන් 03 කින් සමත්ව සිටීම, **සමග**

ii. අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂා, ගණිතය හා තවත් විෂයයන් දෙකක් සඳහා සම්මාන සහිතව විෂයයන් හයකින් සමත්ව සිටීම.

**වැටුප :**

රජය මගින් අනුමත කළ වැටුප සමග 50% මූලික තලයේ දීමනාවක් සහ ඉහත චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව අනුමත කළ දීමනා.

### 17. කාර්යාල සහායක - තනතුරු 03

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. අ.පො.ස. (සා/පෙළ) විභාගය, දෙකකට නොවැඩි වාර ගණනකදී, සිංහල / දෙමළ භාෂා ඇතුළත්ව අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම.

ii. කාර්යාල සහායක ලෙස පළපුරුද්දක් සතුවීම අමතර සුදුසුකමක් වේ.

**වැටුප :**

රජයේ අනුමත වැටුප සමග මූලික පියවර සඳහා 50% දීමනාවක් සහ ඉහත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අනුමත කළ දීමනා.

**වයස :**

අදාළ භාරගනු ලබන දිනය වන විට, තනතුරු 01 සිට 15 දක්වා අවුරුදු 64 ට අඩුවිය යුතු අතර, තනතුරු 16 හා 17 සඳහා අවුරුදු 45 ට අඩු විය යුතුය.

**අමතර පළපුරුද්ද / සුදුසුකම් (තිබීම විශේෂ වේ)**

පහත සඳහන් කරුණු සතු අයහට ප්‍රමුඛතාව හිමිවනු ඇත.

i. විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල පළපුරුද්ද සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් පාලනය කරනු ලබන නීති හා නියමයන් හා කොන්දේසි අර්ථ දැක්වීමේ ප්‍රවීණතාව.

(තනතුරු 01 හා 02)

ii. ගුවන් තොටුපල ව්‍යාපෘති සම්බන්ධව දීර්ඝ කාලයක පළපුරුද්ද.

iii. ගොඩනැගිලි හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල IT, ඉලෙක්ට්‍රොනික් හා ELV පද්ධති පිළිබඳ පළපුරුද්ද.

iv. තනතුරු අංක 15 හා 16 සඳහා ඉංග්‍රීසි ලඝු ලේඛන හා යතුරුලියන වේගය විනාඩියකට වචන 70/25 විය යුතුය.

v. තනතුරු අංක 15 හා 16 සඳහා ලේකම්කරණ පරිචයන් සම්බන්ධ වෘත්තීය සුදුසුකම් තිබීම අමතර සුදුසුකමක් වේ.

vi. තනතුරු අංක 11 හා 12 සඳහා ගිණුම්කරණ මෘදුකාංග භාවිතයේ හැකියාව අමතර සුදුසුකම් වේ.

**සේවයේ යෙදවීමේ නියමයන් :**

කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, **එක් වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමින්** සිදු කරනු ලබන අතර, සතුටුදායක කාර්යසාධනය මත වාර්ෂිකව අලුත් කළ හැක.

### රියදුරු - තනතුරු 11

සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය පියවර II අදියර 2 රියදුරු තනතුරු 11 ක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් :**

i. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.

**වෘත්තීය සුදුසුකම්:**

i. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) පෙර අවම වශයෙන් සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයක් අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)

ii. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

**පළපුරුද්ද:**

වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය)

**කායික සුදුසුකම්:**

i. අවම උස අඩි 05 ක් විය යුතුය.

ii. දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.

**වෙනත් සුදුසුකම්:**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම, සම්පූර්ණ කර තිබිය යුතුය.

**වයස:**

**අවම සීමාව** - අවුරුදු 18ට නොඅඩු
**උපරිම සීමාව** - අවුරුදු 45ට නොවැඩි

**වැටුප් පරාසය:**

2016-03-24 දින දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාර රජය අනුමත දීමනා ගෙවනු ලැබේ.

**කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.**

**අදාළ සේවා ස්ථානය වනුයේ :**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**මිනුවන්ගොඩ පාර, නයිකන්ද, කටුනායක.**

**පොදු කොන්දේසි:**

සේවකයාගේ අර්ථසාධක අරමුදල් (EPF) දායකත්වය 8% වන අතර සේවා යෝජකයාගේ EPF (අර්ථ සාධක අරමුදල්) දායකත්වය 12% සහ ETF (භාරකාර අරමුදල්) දායකත්වය 3% වශයෙන් මාසික වැටුපෙන් අඩුවනු ඇත.

**රැකියා නියාමයන් හා කොන්දේසි:**

පත්වීම මූලික වශයෙන් එක් (01) වසරත් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර ව්‍යාපෘතියේ කාල සීමාව සහ සතුටුදායක කාර්ය සාධනය මත පදනම්ව දීර්ඝ කරගැනීමේ හැකියාව ද පවතී.

**අයදුම්පත්:** අයදුම්කරුවන් විසින් සිය ජීව දත්ත තොරතුරු ප්‍රකාශය (CV) අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සඳහන් කරමින් ඥාතීන් නොවන නිර්දේශකයින් (02) දෙදෙනෙකුත් විමසුම් විස්තරද සමග පහත සඳහන් ලිපිනයට 24/06/2020 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරුවන්ට තම අයදුම් පත පුද්ගලිකව පහත සඳහන් අමාත්‍යාංශ කාර්යාලයට පැමිණ අතින් භාරදිය හැකිය. අයදුම්කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කරනු මැනවි. රාජ්‍ය /අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය;

**ලේකම්, සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශය,**
**06 වන මහල,රක්ෂණ මන්දිරය,**
**අංක 21, වොක්සෝල් වීදිය,**
**කොළඹ 02.**